# කළුතර දිස්ත්‍රික්කය තුළ ගංවතුර ආපදාව හේතුවෙන් ඇතිවන ගැටළු පිළිබඳ අධ්‍යයනයක්

*ඩී.එන්.එච්. පෙරේරා*[1]

ශ්‍රී ලංකාවේ ඇතිවන ආපදාවන් හඳුනා ගැනීමේ දී ගංවතුර සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. අධික වර්ෂාපතන තීව්‍රතාවය හේතුවෙන් ගංගා ජල මට්ටම ඉහළ ගොස් පහත් බිම් තුළට ජලය ගලා යාම තුලින් ජීවිත හා දේපළ සඳහා  හානි ඇති වීම ගංවතුර  ලෙසින් හැඳින්විය හැකිය. ගංවතුර ආපදාව ස්වභාවික සාධක  හේතුවෙන් සිදු වුව ද මිනිස් ක්‍රියාකාරකම් මූලික කරගෙන එහි තීව්‍රරතාව තීරණය වේ. නිරිතදිග මෝසම් කාලවල දී බොහෝවිට ගංවතුර අවදානම ඇති වේ. වාර්ෂිකව ගංවතුර අවදානමට ලක්වන දිස්ත්‍රික්කයක් වශයෙන් කළුතර හැඳින්විය හැක. ගංවතුර ආපදාව හේතුවෙන් නිරතුරුව ප්‍රදේශයේ ජනතාව සමාජ, ආර්ථික හා පාරිසරික ගැටළු සඳහා මුහුණ පෑමට සිදුවේ. කළුතර දිස්ත්‍රික්කය තුළ ගංවතුර හේතුවෙන් ඇතිවන සමාජ, ආර්ථික හා පාරසරික ගැටළු හඳුනා ගැනීම  පර්යේෂණයේ  ප්‍රධාන අරමුණ වන අතර හඳුනාගත් ගැටළු සඳහා අධ්‍යයනය තුළින් තිරසාරාත්මක විසඳුම් ලබාදීම හා ගංවතුර තත්ත්වයට ප්‍රදේශය නිරතුරුව මුහුණපෑම කෙරෙහි බලපාන ස්වභාවික හා මානව හේතු සාධකයන් අධ්‍යයනය අධ්‍යනයේ උප අරමුණු වේ. මෙම අධ්‍යයනය සිදු කිරීම තුළින් ගංවතුර ආපදාවෙන් ජන ජීවිතයට ඇතිවන ගැටළු හඳුනාගෙන එය අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ හැකියාව ලැබුණි. අධ්‍යනයට අවශ්‍ය දත්ත හා තොරතුරු ප්‍රාථමික හා ද්විතීක දත්ත මූලාශ්‍ර ඇසුරින් ලබා ගන්නා ලදී. ප්‍රාථමික දත්තයන් ලබා ගැනීමේ දී ගංවතුර හේතුවෙන් ගැටළුවට ලක්වන ග්‍රාමනිලධාරී වසමක් වන අධිකාරිගොඩ ග්‍රාමනිලධාරී වසම අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගනු ලැබීය. අධිකාරිගොඩ ග්‍රාමනිළධාරී වසම තුළ සමාජ ,ආර්ථික හා පාරසරික ගැටලුවලට මුහුණපාන කුටුම්භ 30ක් සරල සසම්භාවී නියැදිය ඔස්සේ තෝරා ගනිමින් එම කුටුම්භ ඇසුරින් ප්‍රශ්නාවලි ක්‍රමය ඔස්සේ දත්ත රැස් කරනු ලැබීය. සිද්ධි අධ්‍යනයන් හා ව්‍යුහගත නොවන ආකාරයේ සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත ලබා ගැනීම සිදු විය. ද්විතීක දත්ත වශයෙන් කළුතර දිස්ත්‍රික්ක ආපදා කලමනාකරණ ඒකකය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ දත්ත ලබාගන්නා ලදී . එසේ රැස්කරන දත්ත විධිමත් ආකාරයෙන් සකස් කිරීමෙන් පසු වගු ,ප්‍රස්තාර , රූපසටහන් , ඡායාරූප හා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) යොදාගෙන ක්‍රමවත් ආකාරයෙන් විශ්ලේෂණය සිදු කරන ලදි. අධ්‍යනයේ නිගමන ලෙසින් ගංවතුර හේතුවෙන්  ඇතිවෙන ගැටලු  හඳුනා ගනිමින් එම ගැටලු සදහා තිරසාර විසඳුම් ලබාදීම හා අනවසර ඉදිකිරීම් , භූමි පරිහරණය වෙනස්වීම හා වනාන්තර විනාශය යනාදිය හේතුවෙන් ගංවතුර අපදාවේ තීව්‍රතාවය ඉහළ යාම සිදුවන ආකාරය හඳුනාගන්නා ලදී. තවද ගංවතුර උවදුර අවම කරලීම සදහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් ද පර්යේෂණය ඔස්සේ විමර්ශනයට ලක්කරනු ලැබීය.

**මුඛය පද  :** *ආපදා , උපද්‍රව , ගංවතුර , ගැටළු , බලපෑම්*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, dnavodyaharshani@gmail.com